# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,344 - 2023 අගෝස්තු මස 04 වැනි සිකුරාදා - 2023.08.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 488 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 489 |


*සැ. යු.* - ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත 2023 ජූලි මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 අගෝස්තු මස 25 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 අගෝස්තු මස 11 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

487 - B 082479 — 353 (2023/08)
D 1 -

# පිස්කල් විකිණීම්

## නාවලපිටිය දිසා අධිකරණයේ දී ය

### පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, අංක 479 (කළින් අංක 481) දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය සහ නාවලපිටිය, ගම්පොල පාර, අංක 68 දරන ස්ථානයේ ශාඛා කාර්යාලයක් පවත්වාගෙන යන හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී (කළින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

නඩු අංකය : MB 02/13
ස්වභාවය : උකස්
කාර්ය පටිපාටිය : සාමාන්‍ය

.............*පැමිණිලිකරු.*

*එදිරිව*

01. විජේසුන්දර මුදියන්සේලාගේ ඉන්දික තුෂාර මොණරවිල *හෙවත්* ඉන්දික තුෂාර මොණරවිල,
අංක 35, ක්‍රුවුදර්ස් ලෑන්ඩ්,
රඹුක්පිටිය, නාවලපිටිය.

.............*විත්තිකරු.*

**වර්ෂ 2021.08.03** වැනි දින නාවලපිටිය දිසා අධිකරණයේ මෙම නඩු තීන්දුවට අනුව ඉහත සඳහන් විත්තිකරු විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු රු. **2,941,622.37** ක මුදල ද, තීන්දු ප්‍රකාශිත දින සිට නෛතික පොලිය ද, තක්සේරු නඩු ගාස්තු ද, එම මුදල වෙනුවට විකල්ප වශයෙන් පැමිණිල්ලේ 'ඇ' ඡේදයේ සඳහන් සහන ප්‍රදානය කර ඇති බවට තීන්දු ප්‍රකාශකර ඇති බැවින්,

එකී ගෙවීම් කිරීමට විත්තිකරු අපොහොසත් වී පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කීසි බලපත්‍රයේ බලයපිට මා විසින් **වර්ෂ 2023 ක් වූ අප්‍රේල් මස 20** වැනි දින තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ,

**වර්ෂ 2023ක් වූ අගෝස්තු මස 24 වැනි දින පෙ. ව. 11.00** ට මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩබුලත්ගම පස්බාගේ කෝරළේ, රඹුක්පිටියෙ හි, ක්‍රුවුදර්ස් ලෑන්ඩ් හි පිහිටි අංක 25 දරන ඉඩම පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩබුලත්ගම, පස්බාගේ කෝරළේ, රඹුක්පිටියෙ හි පිහිටි 'ග්‍රොත්හවුස්' නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ටී. ගුණසේකර විසින් මැන සාදන ලද 1993.11.18 සහ 21 දිනයන් සහ අංක 5663 දරන පිඹුර ප්‍රකාර ලොට් 35 ලෙස ලකුණුකර ඇති ඉඩම් කොටසට මායිම් : උතුරු නැගෙනහිරට : ලොට් 34 ද, දකුණු බස්නාහිරට සහ බස්නාහිරට : කේ. ඒ. අමරසේනට අයත් ඉඩමෙන් ද මායිම් වූ පර්චස් දහහතර (පර්. 14) ක් විශාල ඉඩම තුළ පිහිටි පස්, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියලුම දේත් සමග වේ.

මෙම ඉඩම ගම්පොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 66/162 හි ලියාපදිංචි කර ඇත.

ටී. අයි. වික්‍රමආරච්චි,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
නාවලපිටිය.

වර්ෂ 2023ක් වූ ජූලි මස 11 වැනි දින,
නාවලපිටිය දිසා අධිකරණයේ දී ය.

08-51

# විවිධ දැන්වීම්

## සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාත්බද (වාණිජ) මහාධිකරණයේ දී ය

### පෙත්සම පිළිබඳ දැන්වීම

නඩු අංකය : CHC/39/2023/CO

අංක 325 ඩී, මාකස් පාර, උස්වැටකෙයියාව හි පිහිටි කිංග්ස්ටන් පෙට් ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් පිළිබඳ කාරණාවේ දී ය.

2007 අංක 07 දරන සමාගම් පනතේ 521 වගන්තිය සමග කියවෙන එකී පනතේ XII පරිච්ඡේදය යටතේ සහ ප්‍රකාර ව කරනු ලබන අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා වන අයදුම්පතක් පිළිබඳ කාරණාවේ දී ය.

(1) රත්නායක මුදියන්සේලාගේ පල්ලෙහා හෙට්ටිගෙදර දසනායක, අංක 15/5, පළමුවන පටුමග, පල්ලිය පාර, පැලවත්ත, බත්තරමුල්ල.

(2) අගම්පොඩි රාජවික්‍රම පෙරේරා අමරවික්‍රම රාජකරුණා, ''සමුද්‍රා'', පාත්ගම, බළපිටිය.

*..............පෙත්සම්කරුවන්.*

සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වන බස්නාහිර පළාතේ මහාධිකරණය විසින් ඉහත නම සඳහන් සමාගම ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා පෙත්සම්කරුවන් වන බත්තරමුල්ල, පැලවත්ත, පල්ලිය පාර, පළමු පටුමග, අංක 15/5 හි පදිංචි, රත්නායක මුදියන්සේලාගේ පල්ලෙහා හෙට්ටිගෙදර දසනායක සහ බලපිටිය, පාත්ගම, ''සමුද්‍රා'' හි පදිංචි අගම්පොඩි රාජවික්‍රම පෙරේරා අමරවික්‍රම රාජකරුණා යන අය විසින් **2023 ජූනි මස 13** වැනි දින එකී අධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කරන ලද බවත්, එකී පෙත්සම **2023 සැප්තැම්බර් මස 15 වැනි දින** එකී අධිකරණය ඉදිරියේ ඇසිය යුතු බවට නියමකර ඇති බවත්, එකී පෙත්සම මත නියෝගයක් කිරීමට සහයෝගය හෝ විරෝධය හෝ දැක්වීමට කැමති එකී සමාගමේ යම් ණයහිමියකු හෝ දායකයකු එකී පෙත්සම අසන වේලාවේ දී පුද්ගලිකව හෝ නීතිඥ හෝ ලේඛනගත නීතිඥයකු මගින් එම අරමුණ වෙනුවෙන් පෙනී සිටීමට හැකි බව මෙයින් දන්වනු ලැබේ. තව ද, පෙත්සමේ පිටපතක් ඒ සඳහා නියමකර ඇති ගාස්තු ගෙවීම මත එය අවශ්‍ය වන සමාගමේ ණය හිමියකු හෝ දායකයෙකුට පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන්නේ ය.

නීතිඥ එස්. ජී. ඒ. ගුණසේකර,
පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥ,
අංක 12ඒ, සුභද්‍රාරාම පටුමග, නුගේගොඩ.

*සටහන :*

එකී පෙත්සම ඇසීමේ දී පෙනී සිටීමට අදහස් කරන යම් පුද්ගලයෙකු එසේ කිරීමට ඇති ඔහුගේ අදහස ඉහත නම් සඳහන් නීතිඥවරිය වෙත ලිඛිතව හෝ තැපැල් මගින් භාර දිය යුතු ය. තැපැල් මගින් එවීම අවශ්‍යවන පුද්ගලයින්ගේ නම් සහ ලිපිනය හෝ යම් ව්‍යාපාරයක් නම් එහි නම සහ ලිපිනය නොතිසියේ සඳහන් කිරීම අවශ්‍යවන අතර, එය පුද්ගලයා හෝ සමාගම හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ ලේඛනගත නීතිඥයන් ඇත්නම් ඔවුන් විසින් හෝ අත්සන් කරනු ලැබීම හා එය **2023 සැප්තැම්බර් මස** 13 **වැනි දින** පස්වරුවේ **වේලාව 6.00ට පෙර** ඉහත නම් සඳහන් අයට ලැබෙන සේ කල් වේලා ඇතිව භාර කිරීමට හෝ තැපැල් කරනුයේ නම්, එසේ කිරීම අවශ්‍ය වේ.

නීතිඥ එස්. ජී. ඒ. ගුණසේකර,
පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥ.

08-58

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2023 වර්ෂය** | | | |
| **අගෝස්තු** | 2023.08.04 | සිකුරාදා | 2023.07.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.08.11 | සිකුරාදා | 2023.07.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.08.18 | සිකුරාදා | 2023.08.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.08.25 | සිකුරාදා | 2023.08.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **සැප්තැම්බර්** | 2023.09.01 | සිකුරාදා | 2023.08.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.09.08 | සිකුරාදා | 2023.08.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.09.15 | සිකුරාදා | 2023.09.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.09.22 | සිකුරාදා | 2023.09.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.09.27 | බදාදා | 2023.09.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2023.10.06 | සිකුරාදා | 2023.09.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.10.13 | සිකුරාදා | 2023.09.27 | බදාදා | දහවල් | 12.00 |
| | 2023.10.20 | සිකුරාදා | 2023.10.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.10.27 | සිකුරාදා | 2023.10.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.